## 15. 1994 අංක 03 දරන දකුණු පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.

මෙම ප්‍රඥප්තිය 1994 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.
සභාපති, දකුණු පළාත් සභාව
1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය

**<u>සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.</u>**

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

**01.** මේ ප්‍රඥප්තිය 1994 අංක 03 දරන දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**02.** 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය එහි "මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධාන වලට අනුකූල වේ" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට "මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥා පනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥා පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධිවිධානවලට අනුකූල වේ." යන වචන ආදේශ කිරීම මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

**03.** මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වූ විටෙක සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල නාමය බලපැවැත්විය යුතු බව

> දකුණු පළාත් සභාව මගින් සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන සංශෝධනයේ 154 එච් වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 1994.12.02 දින අනුමත කර ඇත.